# බුදුදහමින් පෝෂණය වූ අශෝක ධර්මය පිළිබඳ අධ්‍යයනයක්

**උල්පතගම අමිතරතන හිමි**

## හැඳින්වීම

භාරතයේ පහළ වූ පාලකයන් අතර අතිවිශිෂ්ට පාලකයෙකු ලෙස අශෝක අධිරාජ්‍යතුමා හැඳින්විය හැකිය. ඔහුගේ රාජ්‍ය පරම්පරාව පිළිබඳව සාකච්ඡා කිරීමේ දී භාරතීය රාජාවලියෙහි චන්ද්‍රගුප්තයන් මුල් කොට ගෙන ආරම්භ වූ මෞර්ය රාජවංශය යි. දෙවෙනි අධිරාජ්‍යයා ලෙස බලයට පත් වූයේ බිම්බිසාර මහරජුය. ඔහුගේ ඇවෑමෙන් රාජ්‍යත්වයට පත් වූයේ අශෝක අධිරාජ්‍යාය.

ලෝකයේ පහළ වූ රජවරුන් අතර ඇලෙක්සැන්ඩර් රජු ඉතා බල සම්පන්න අධිරාජ්‍යයයෙක් බවට පත් විය. ඔහු විසින් සිදුකරන ලද භාරත ආක්‍රමණයත් එතුමාගෙන් පසු ඇති වූ අවුල් වියවුල් තත්ත්වයත් පදනම් කොට ගනිමින් චන්ද්‍රගුප්තයන්ගේ මෞර්ය රාජ්‍ය ආරම්භ වීමට අවස්ථාව සලසා දුන් බවක් දක්නට ලැබේ. ඒ අනුව චානක්‍ය බ්‍රහ්මණයාගේ උපදෙස් මත විවිධ අභියෝග මධ්‍යයේ රාජ්‍ය බලය මොවුන් විසින් ගොඩනංවා ගන්නා ලදී.

"ක්‍රි පූ 324 න් ආරම්භ වූ චන්ද්‍ර ගුප්තගේ රාජ්‍ය කාලය සූවිසි වසකට සීමා වූ නමුත් මෞර්ය රාජ්‍ය පරම්පරාව එතැනින් අවසන් නොවී චන්ද්‍ර ගුප්තගේ පුත් බින්දුසාර නිසැක ලෙසම පියාගේ රාජ්‍ය විශාල කළ බව දැකිය හැකිය. එසේ ක්‍රමිකව විකාශනය වූ රාජ්‍ය සමය තුළ අශෝක රජුගේ පහළ වීම සම්බුද්ධ සාසනයේ සහ රාජ්‍ය පාලනයේ වැදගත් සන්ධිස්ථානයක් බවට පත්විය.''[1]

අශෝක රජු තරුණ වියේ රාජ්‍ය තන්ත්‍රය භාරගත් නමුත් කාලිංග යුද්ධයෙන් පසු අතිශය කනස්සල්ලට පත්විය. ඔහුගේ ගමන් මග සම්පූර්ණයෙන් වෙනස් කිරීමට කාලිංග යුද්ධයම බල පෑ බව

දක්නට ලැබේ. විශාල මිනිස් සංහාරයක් වූවායින් පසුව එහි පීඩාකාරී බව කෙතරම් දැයි ඔහුගේ චරිත ලක්ෂණවලින් මනාව පිළිබිඹු විය. සිය සෙබලුන්ගේ කෲර ක්‍රියාවලින් දුකට පත් කාලිංග ජනතාව දැකීමෙන් ඇති වූ මානසික පරිවර්තනය උඩ එතුමාගේ බුද්ධිය විකාශනය වූ බවක් දක්නට ලැබේ. මෙසේ සඳළු තලයට වී අතීත සිදුවීම් පිළිබඳ සිහිපත් කරමින් කනස්සල්ලෙන් පසුවන අශෝක අධිරජහට මාර්ගයේ ඉතා ප්‍රසන්න දර්ශනයක් දක්නට ලැබුණි. ඒ නිග්‍රෝධ සාමණේරයන් වහන්සේ සන්සුන් ගමනින් මාර්ගයේ වැඩම කරන ආකාරය යි. මිනිසුන් අතරින් සියල්ල අතහැර දමා සැහැල්ලු සුපහන් දිවියක් ගත කරන එම සාමණේරයන් වහන්සේ දුටු පමණින් රජුගේ සිත ප්‍රසන්න භාවයට පත්විය. උන්වහන්සේ තම රජ මාළිගයට කැඳවා තොරතුරු විමසූ කල උන්වහන්සේ සඳහන් කර සිටියේ තමන් වහන්සේ බුද්ධශ්‍රාවකයෙකු බවයි. ඒ අනුව බුදු දහම පිළිබඳ විමසූ රජුහට අප්‍රමාදීව කටයුතු කිරීමේ ආදීනව පිළිබඳ දේශනා කිරීමෙන් අනතුරුව අශෝක රජු අතිශය සතුටට පත්ව එතෙක් කලක් පරම්පරාවෙන් රැගෙන ආ බ්‍රාහ්මණ ධර්මයන් අතහැර දමා බුදු දහම වැළඳ ගන්නා ලදී. මේ කාල පරිච්ඡේදය විවිධ දුර්මතධාරීන්ගෙන් සම්බුදු සසුන පරිහානියට පත්ව තිබූ යුගයකි. මොග්ගලිපුත්තතිස්ස තෙරුන්ගේ අනුශාසනා ඇතිව සියලු දුර්මතධාරීන් සසුනෙන් නෙරපාහැර සම්බුද්ධ සාසනය නැවත සුරක්ෂිත කිරීම සඳහා අශෝක රජු විශාල රාජ්‍ය අනුග්‍රහයක් ලබා දෙන්නට විය. තෙවෙනි ධර්ම සංගීතිය සිදු කොට නව රට සසුන් පිහිටුවා භාරත දේශය තුළ ගම් නියම් ගම් පාසා ධර්මය ප්‍රචාරය කිරීම සඳහා අවශ්‍ය ක්‍රමවේද ගොඩනංවන ලදී.

අශෝක රජු තම රාජ්‍ය තන්ත්‍රය ගොඩනංවා ගැනීමේ දී බුදුරජාණන් වහන්සේ පන්සාලිස් වසක් මුළුල්ලේ දේශනා කළ ධර්මය මනා කොට උපයෝගි කොටගත් බවක් ඔහු විසින් පිහිටුවන ලද ශිලා ලේඛන අධ්‍යයනය කිරීම මගින් අනාවරණය වේ. අශෝක ධම්ම ලිපි නමින් දැනට ඒවා හඳුනාගෙන ඇත. ඒවා බුදු දහම ආශ්‍රයෙන් සකස් කළ විධි විධාන වේ. මෙම ධර්ම ව්‍යාපාරය ධර්ම මහා මාත්‍ර මගින් හෙවත් ධර්මය කියා දෙනු ලබන අමාත්‍යවරයෙකු මඟින් පාලනය කරනු ලැබූ බව පැහැදිලි වේ.

අශෝක රජු ඇති කළ නව නිළයක් වූ ධර්ම මහාමාත්‍ර පදවියයි. ධර්මවිජය පිළිවෙත ක්‍රියාත්මක කිරීමේ භාරදූර වගකීමක් පැවරීමේ අටියෙන් මෙම තනතුර ස්ථාපනය කරන ලද බව පෙනේ.[2]

දෙවනපිය රජතුමා තවදුරටත් මෙසේ කියයි. මේ ආඥාව රාජමහාමාත්‍යාදීන් රැස්වන තැන කොටවා තබනු ලැබේ. පොදු ජනයාටත් පෙනෙන ලෙස මෙබඳු ලිපියක පිටපතක් මිනිසුන් රැස්වන තැන කොටවා තැබිය යුතුයි. සෑම පෝය දිනකම මිනිසුන් මෙහි ඇවිත් එය කියවා තේරුම් කරගෙන මතක තබාගත යුතුය. පෝය දිනයන්හී තම කාර්යාලවලට පෙරලා පැමිණෙන මහාමාත්‍යවරු මේ ආඥාවත් නිසිසේ ක්‍රියාවේ යෙදවිණි ද යන වග බලාගත යුතුය. සෑම මහාමාත්‍යවරයෙකුම තම තමන්ට අයත් කොට්ඨාශවල චාරිකාවෙහි යෙදී මේ ආඥාව කියාදී එය නිසිසේ ක්‍රියාවේ යොදවනවාද යි විමසා බැලිය යුතුය. සියලූම බලකොටුවලත් සෑම පළාත්වලත් මේ ආඥාව එකසේ පිළිපැදිය යුතුය.[3]

තම රාජ්‍ය පාලනය යටතේ පවත්නා සියලු ප්‍රදේශයන්හි ජනතාවගේ සතුට වෙනුවෙන් ද, ඔවුන්ගේ සුබ සාධනය වෙනුවෙන් ද, නියෝග මාලාවක් පණවා තිබේ් අශෝක රජු දැහැමි රාජ්‍ය පාලනයක් ගෙන යෑම සඳහා සියලු කරුණු ඇතුළත් කොට මහජනතාවගේ දැන ගැනීම පිණිස හා ඔවුන් ඒ සඳහා පෙළඹවීම පිණිස ආදර්ශ ලේඛන වශයෙන් ප්‍රසිද්ධ ස්ථානවල ශිලා ලේඛන ස්ථාපනය කොට ඇත.

අශෝක රජුගේ අභිෂේකයෙන් 27 වැනි වර්ෂයේ දිල්ලි තෝපාර් ශිලාස්ථම්භයේ සඳහන් කරනුයේ තමන් යටතේ සිටින. සියලු මිනිසුන් මාගේ දරුවෝය. ඔවුන් මාගේ දරුවන්වන බැවින් මගේ ම දරුවන් වේ. ඔවුන්ගේ සුබසාධනය වෙනුවෙන් සම්පූර්ණ පහසුකම් මා විසින් සැපයිය යුතුය. ඔවුන්ගේ සන්තෝසය උදෙසා මා ක්‍රියා කළ යුතුය, යනුවෙනි.

''යම් සේ මනුෂ්‍යයෙක් තමාගේ ළදරුවා දක්ෂ වූ සුවිනීත කිරි මවකුට භාරදී සිත් සොම්නස්ව ඒ දක්ෂ විචක්ෂණ කිරිමව් තොමො මාගේ ළදරුවා මනාසේ රැකබලා ගන්නීය යි. යම්සේ සිතා ද එසේම රාජ්‍ය වාසීන්ගේ හිත සැප පිණිස මම ආණ්ඩුකාරවරුන් පත් කළෙමි.

නිර්භයව ද නිරුපද්‍රිතව ද සංසුන්ව ද තමන්ගේ රාජ්‍ය කාර්යයන් ඉටු කිරීමට හැකිවනු සඳහා නම්බුනාම ප්‍රදානය කිරීමට සහ දඬුවම් පැමිණවීමට ආණ්ඩුකාරවරුන්ට බලය පවරා දුනිමි. ආණ්ඩු ක්‍රමයෙහි ද දඬුවම් පැණවීමෙහි ද දේශපාලන ක්‍රමය එක පිළිවෙළක් ඇති වීම මැනවැයි යන අදහසින් මාගේ ආඥාව මෙපමණක් දුර පවතී.''[4]

පරිපාලන කටයුතු සම්බන්ධයෙන් ධෞලි ගිරි ලිපියෙහි සඳහන් කරනු ලබන්නේ සියලු රාජ්‍ය තාන්ත්‍රික කටයුතු කෙරෙහි තමන්ගේ විශේෂිත වූ අවධානය යොමු කොට ඇති බවය.

''ජනයාගේ යහපත හා සුබ විහරණය වෙනුවෙන් මාගේ අවධානය යොමු වී තිබේ. මාගේ දුර හා ළඟ ඥාතීන්ට පමණක් සතුට ලංකර දීම මා අපේක්ෂා නොකරමි. තව ද විවිධ තරාතිරම්වලට අයත් ජනයා කෙරෙහි මාගේ අවධානය යොමු කරමි. ඒ සියලු ජනයා මා වෙත විශ්වාසය තබා ඇත්තේය.''[5]

මීට අමතරව ගිරි ලිපි අංක (5) හී ඔහු මෙසේ සඳහන් කරයි. ''සෙ අතිකංතං අංතලං නො හුතපුලුව ධංම්මහාමාතා නාම තෙ දසවසාබිසිතෙනා මමයා ධංමමහාමාතා කඨා තෙ සවපාසං ඩෙසු වියාපතා ධංමාධිඨානායෙ වා ධංමවඩියා හිද සුඛායෙ වා ධංමයුතසා යොන කාම්බොජ ගංධාලානං ඒ වා පි අංනෙ අපලතො භටම සෙසු බංභනිහෙසු අනථෙසු වුධෙසු හිදසුඛායෙ ධංමයුතායෙ අපලිබොයෙ වියාපටාතෙ බංධන වධසා පටිවිධානායෙ අපලිබොධායෙ මොඛායෙ වා එයං අනුබධං පජාච ති වා කටාභිකාලෙ ති වා මහාලකෙ ති වා වියා පටා.''[6]

''දෙවනංප්‍රිය ප්‍රියදර්ශි රජතුමා මෙසේ අණ කරයි කිසිවෙකු විසිනුත් භික්ෂු සංඝයා භේද නොකළ යුතුයි. සංඝ භේද කළ යම් පුද්ගලයෙක් ඇත් නම් ඔහු භික්ෂුවක් හෝ භික්ෂුණියක් හෝ වේවා සුදු ඇඳුම් අන්දවා විහාරාරාමාදියෙන් පිටත් කළ යුතුයි. මේ ආඥාව භික්ෂු සංඝයා මැද්දෙහි ද ප්‍රසිද්ධියේ කියවිය යුතුය.''[7]

බෞද්ධ පූජ්‍ය පක්ෂයට විශේෂ සංග්‍රහ දක්විය යුතුයි. එමෙන් ම ආජීවකයන්ට, නිගණ්ඨයින්ට මෙන් ම අනෙක් ආගමිකයන්ට ද එම සහනය ලබා දිය යුතුය. එසේ ම සියලු ආගමිකයින්ට සමානව

සැලකිම සහ වචනයෙහි යහපත් බව කෙරෙහි සිය විශේෂ අවධානය යොමු කොට තිබේ. මේ කරුණු තුළින් පැහැදිලි වන්නේ බුදු දහමේ උගන්වනු ලබන සමානාත්මතාවයි. හැම විටම බුදු දහම අවධාරණය කරනු ලබන්නේ සමාජයේ ජීවත්වන සියලු දෙනා වෙත එක හා සමානව සැලකීමට හැකි නම් එම සමාජය තුළ ගැටීම් ඇති නොවන බවයි ඒ බව දීර්ඝ විස්තරයක් දීඝනිකායේ අග්ගඤ්ඤ සූත්‍රය තුළින් මනාව පිළිබිඹු කරයි. එමෙන් ම බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලාහට දේශනා කොට ඇත්තේ ඇල, දොළ, ගංගා මගින් ගලාගෙන යන ජලය මුහුදට වැටුණු පසු එකම ලුණු රසයක් දනෙන්නාක් මෙන් පුද්ගලයෙකුගේ තරාතිරම නොබලා සමානාත්මතාවයෙන් යුක්තව වැඩ කළ යුතු බවය. එපරිද්දෙන් ම අශෝක රජු සඳහන් කරනුයේ ගිහි සමාජය තුළ ද එකිනෙකා අතර සමානත්වයක් තිබිය යුතු බවය. එම අවවාදය ඉතා මැනවින් ග්‍රහණය කොට ගෙන ඇති බවක් මෙම කරුණු තුළින් මනාව දැකගත හැකිය.

මීට අමතරව සියලු මනුෂ්‍යයන්ට හා ගවයන්ට තම පාලන ප්‍රදේශවල හා ඉන් පිටත ද වෛද්‍ය පහසුකම් ද, එමෙන් ම මහාමාර්ග සකස් කොට ගමනාගමන පහසුකම් සැලසිය යුතු බව ද සඳහන් කොට තිබේ. රාජාභිෂේකයෙන් 27 වැනි වර්ෂයේ ගිරි ලිපි අංක 2 හි සඳහන් කොට ඇත්තේ මග දෙපස නුග ගස් හා අඹ ගස් රෝපණය කළ යුතු බවයි. සුදුසු ස්ථානවල විවේක ස්ථාන සකස් කළ යුතුය. එමෙන් ම ළිං සකස් කළ යුතුය. ඒවාට බැසීම සඳහා පඩි පේළි සකස් කළ යුතුය යනුවෙනි.

"ඔසධානි මනුස්සො පගානි චා පසොපගානි ච අතතා නථි සචතා හාලාපිතා චා ලොපාපිතා චා එවමෙචා මූලානි චා ඵලානි චා අතතා නථි සචතා හාලාපිතා චා ලොපා පිතා චා මගෙසු ලුඛානි ලොපිතානි උදුපානානි චා ඛානාපිතානි පටිභොගායෙ පසුමුනිසානං"[8]

ඒ අනුව බුදුරජාණන් වහන්සේ සංයුත්ත නිකායේ ආදිත්ත වග්ගයේ වනරෝපා සූත්‍රයේ දී පෙන්වා දෙනු ලබන්නේ පරිසර සංවර්ධනය සඳහා ගස් වැල් රෝපනය කිරීම, ළිං පොකුණු තැනීම, ඒවාට බැසීමට පඩිපේළි සකස් කිරීම ආදී කටයුතු තුළින් දිවා රාත්‍රියේ පිං වැඩෙන බවය. මේ සම්බන්ධව අසෝක සිරිතෙහිද කරුණු දක්වා

තිබේ. ''සාමාජික අතින් පැං පොකුණු කරවා උයන්වතු බෙත්වතු ඇති කරවා මිනිස් තිරිසන් දෙවගටම සෙත් සැලසූ වග ද සත්වැනි ස්ථම්භ ලේඛනයෙහි (28) එන්නේ මෙසේය. දෙවනපිය පියදස්සි (රජ) තෙමේ මෙසේ කියයි. සතුන්හට සහ මිනිසුන්හට ද සෙවන ලැබේවායි මා විසින් මහාමාර්ගවල නුග ගස් සිටුවන ලදී. අඹ උයන් රෝපනය කරවන ලදි. කෝශ අටෙන් අවට මවිසින් ළිං කරවන ලදී. විශ්‍රාමශාලා පිහිටුවන ලදි. සතුන්ගේ සහ මිනිසුන්ගේ ප්‍රයෝජනය සඳහා තැනින් තැන පැන්හල් පිහිටුවන ලදී. ''[9]

ආරාම රොපා වන රොපා - යෙ ජනා සෙතු කාරකා

පපඤ්ච උදපානඤ් ච - යෙ දදන්ති උපස්සයං

තෙසං දිවා ච රත්තො ච - සදා පුඤ්ඤං පවඩ්ඪති

ධම්මට්ඨා සීල සම්පන්නා - තෙ ජනා සග්ගමිනොති[10]

ඉහත සඳහන් සූත්‍රපාඨයට අනුව අශෝක රජු තම පාලන තන්ත්‍රය ගෙනයෑම සඳහා නිරන්තරයෙන් බුදුදහමේ අඩංගු ධර්ම කරුණු ප්‍රායෝගිකව උපයෝගි කොට ගෙන ඇති බවක් දැකගත හැකිය. හතරවෙනි ගිරි ලිපියෙහි මව්පියන්ට සැලකීම, වැඩිහිටියන්ට ගෞරව කිරීම, ඥාතීන්ට සංග්‍රහ කිරීම, දහමෙහි මනාකොට හැසිරීම, කල්‍යාණ මිත්‍රයන් ආශ්‍රය කිරීම ආදී යහපත් කරුණු රාශියක් ජනතාව විසින් අනුගමනය කළ යුතු බව දක්වා තිබේ. ඒ අනුව ඉහත සඳහන් කළ තොරතුරු ඛුද්දක නිකායේ මහා මංගල සූත්‍රය තුළ අන්තර්ගත වන බොහෝ කරුණු ප්‍රමාණයක් මේ නීති මාලාවන් සඳහා යොදාගෙන ඇති බව දක්නට ලැබේ.[11]

එසේ ම අශෝක රජු මිනිසුන්ට මෙන් ම සත්ත්වයින්ට ද බොහෝ සෙයින් කරුණාව දක්වා තිබේ. එම අදහස ද ධර්මය තුළින් උකහා ගන්නට ඇති බවක් සිතිය හැකිය. ගිරි ලිපි අංක දෙකෙහි සඳහන් කරන්නේ මිනිසුන්ට මෙන් ම සත්ත්වයින්ට අවශ්‍ය ඖෂධ වර්ග යම් යම් තැනක නැති නම් ඒ ඒ ස්ථානවල ගෙන්වා තබන ලෙස ය. එමෙන් ම අශෝක රජු උත්සව කටයුතු සඳහා සත්ත්ව ඝාතනය නොකළ යුතු බව දන්වයි. බිලි පූජා සඳහා සත්ත්ව ඝාතනය කිරීම තහනම් කොට තිබේ. එහෙත් තමාගේ රාජභෝජන සකසන මුළුතැන්ගේ ආහාර

සඳහා සත්ත්වයින් ඝාතනය සම්පූර්ණයෙන් අතහැර දමා නැති බව ඔහු කියයි. මුළුතැන්ගේ ආහාර සඳහා දිනපතා සතුන් තුන් දෙනෙක් ඝාතනය කිරීම පිළිබඳ රජතුමා බෙහෙවින් කනගාටුවට පත් විය. අනාගතයේ ක්‍රමයෙන් තම මුළුතැන් ගෙයිද සම්පූර්ණයෙන් ම සත්ත්ව ඝාතනය නතර කරන බව ඔහු එහිදී පොරොන්දු විය. අවිහිංසා ධර්මය තම දේශනාවන්හි ප්‍රධාන අංගයක් බව උපෝසථ දිනයන්හි දී සත්ත්ව හිංසනය විශේෂයෙන් වැළැක් වූ බවට සඳහන් වීමෙන් පැහැදිලි වේ. උත්සව අවස්ථාවල දී සත්ව හිංසනය ද බිලි පූජාවන් ද නොකළ යුතු ලැයිස්තුවට අන්තර්ගත කොට තිබේ. ගොං පොර හා සතුන් යොදා ගන්නා තරග තහනම් කොට තිබේ. එමෙන් ම බුදුරජාණන් වහන්සේ දේශනා කරන ලද දසරාජ ධර්ම මෙන් ම දස සක්විති වත් ආදී බෞද්ධ පාලකයෙකු විසින් අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙත හොඳින් අනුගමනය කොට ඇති බව පැහැදිලි වේ'' හෙතා ඉයං දාස භටකසී සම්‍යාපටිපති ගුලුනා අපචිති පානානං සයමෙ,[12]

ඛුද්දක නිකාය ධම්මපද පාලියේ දණ්ඩ වග්ගයේ පළමු ගාථාව තුළින් බුදුරජාණන් වහන්සේ සත්ත්ව හිංසාව ප්‍රතික්ෂේප කොට තිබේ. මෙහි දී උන්වහන්සේ සඳහන් කරන්නේ හැම විටම තමන් උපමාවට ගෙන අන් අයට හිරිහැර නොකරන ලෙසය.

සබ්බෙ තසන්ති දණ්ඩස්ස
සබ්බෙ භායන්ති මච්චුනො
අත්තානං උපමං කත්වා
නහණෙය්‍ය න ඝාතයෙ[13]

මෙම ගාථාවේ අර්ථයට අනුව අශෝක රජු තම රට වැසියාට පෙන්වා දෙන්නේ සතුන් නොමැරීම පුණ්‍යවන්ත ක්‍රියාවක් බවති. සත්ව ඝාතනයෙන්, සත්ත්ව හිංසනයෙන් තොරවීම උතුම් මනුෂ්‍ය ගුණ ධර්ම සඳහා හේතු වන බවත් ය. එමෙන් ම අසෝක සිරිතෙහි මේ පිළිබඳ කරුණු දක්වා තිබේ. ''සතුන් මැරීම යාග හෝම පැවැත්වීම නුසුදුසු යයි පිළිගත් අහිතකර සමාජ ගොෂ්ඨී හෙවත් සමාජ උත්සව නවතාලූ අසෝකයෝ සත්නට අභය දී සමාජයට හිතකර උත්සව අනුමත කළහ.''

අශෝක ධර්මයේ පරිත්‍යාගය හෙවත් දානය උසස් කොට සලකා තිබේ. දිල්ලි තෝපාර් 07 වැනි ශිලා ලේඛනයේ දක්වෙන ආකාරයට රජතුමා කරන ලද කුසල කර්මයන් අතර දානය ද එකකි. රජතුමාගෙන් හා රැජිණියගෙන් ත්‍යාග ලබන ජනතාව ඒවා බෙදා දීම සඳහා නිලධාරීන් පත්කොට තිබේ. මෙයින් අදහස් කරන්නේ උතුම් ගුණ ධර්ම රට තුළ ස්ථාපනය කිරීමට රජු ක්‍රියා කළ බවයි. ගිහියාගේ අත් පොත වන ධම්මපදයෙහි ගිහි ජීවිතය අර්ථවත් එකක් බවට පත් කර ගැනීම සඳහා ඉතා වටිනා උපදෙස් රාශියක් ලබා දී තිබේ. ඒ අනුව ගිහි ජීවිතය තුළ තෘප්තිමත් සන්තෝස සහගත ජීවිතයක් ගත කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දී තිබේ. ඒ අනුව ගිහි ජීවිතය තුළ ඇත්ත කිව යුතුය. නොකිපිය යුතුය. ටිකක් තිබෙන විට දී නමුත් යමකු යමක් ඉල්ලූවිට ටිකක්වත් දිය යුතුය. මේ කරුණු තුනෙන් දෙවියන් සමීපයට යා හැකිය.[14]

සච්චං භණේ න කුජ්ඣෙය්‍ය
දජ්ජාප්පස්මිං පි යාචිතෝ
ඒතේහි තීහි ඨානේහි
ගච්ඡේ දෙවාන සන්තිකේ ''[15]

¨හත් වන ගිරි ලිපියෙහි සඳහන් කරන්නේ තෘප්තිමත් ජීවිතයක් ගත කිරීම සඳහා මිනිසා ක්‍රියා කළ යුතු ආකාරය යි. කිසිවිටකත් කිසිවෙක් උසස් කොට හෝ පහත් කොට නොසැලකිය යුතුය''[16] යමෙකුට යමක් නැති නම් ඇති අය ඒවා ලබාදිය යුතුය. සමාජයේ ජීවත් වන ශක්ති සම්පන්න අය දුර්වල මිනිසුන් තලා පෙලා නොදැමිය යුතුය. ආදී කරුණු පිළිබඳ විශේෂ අවධානයක් යොමු කොට තිබේ. එහි අඩංගු ධර්ම කරුණු අශෝක රජු තම පාලන තන්ත්‍රය සඳහා ප්‍රායෝගිකව යොදාගත් බවක් දක්නට ලැබේ.

ඔහුගේ හතරවන ගිරි ලිපියේ යහපත් පැවැත්ම සඳහා ශීලය හේතුවන බව සඳහන් කරයි. එය බුදු දහමෙහි පහත දක්වෙන ධම්මපද ගාථාවෙන් අර්ථවත් වේ.

සීලදස්සනසම්පන්නං
ධම්මට්ඨංසච්චවාදිනං
අත්තනෝ කම්ම කුබ්බානං
තං ජනෝ කුරුතේ පියං[17]

චතු පාරිශුද්ධි ශිලයෙන් හා සම්‍යක් දෘෂ්ඨියෙන් යුක්ත වූ ධර්මයෙහි පිහිටා ඇත්ත කියන සුළු වූ තමාගේ කටයුතු කරන පුද්ගලයාට ජනයා ප්‍රිය කරයි. එපරිද්දෙන් ගැටීමෙන් තොර සමාජ පරිසරයක් ගොඩනැංවීම සඳහා සීලය තම ජීවිතයට ලං කරගත යුතු බව පෙන්වා දී තිබේ.

එමෙන් ම පස්වෙනි ගිරිනාර් ලිපියේ පව් කිරීම පහසු බව කියයි. එම කාරණය ධම්මපදයෙහි මෙම ගාථාව තුළින් මනාව පිළිබිඹු වේ. තමන්ට අහිතකර වූ අයහපත් දේ පහසුවෙන් කළ හැකිය. තමන්ට හිතකර වූ ද යහපත් වූ ද දේ කිරීම ඉතාම දුෂ්කරයි.

සූකරානි අසාධූනි
අත්තානෝ අහිතානි ච
යං චේ හිතං ච සාධූං ච
තං චේ පරම දුක්කරං[18]

අනුන්ගේ වරද ලෙහෙසියෙන් දැක්ක හැකිය. තමාගේ වරද දැකීම අපහසුය. අනුන්ගේ වරද සොයන තැනැත්තා අනුන්ගේ වැරදි දහයියා මෙන් පොළා පෙන්වයි. හේ සිය සිරුර සඟවන කපටි ලිහිණි වැද්දෙකු මෙන් තමාගේ වරද සඟවයි.

3 - F වෙනි ගිරි ලිපියේ ආශ්‍රව හා ක්ලේෂ පිළිබඳව සඳහන් වේ. හටගත් ආශාවන් හා ක්ලේශ තරහ යටපත් කොට ගෙන ක්‍රියා කිරීම පැහැදිලි කොට තිබේ.[19]

ජෞගඩා ගිරි ලිපියේ අසාධාරණය වෙනුවෙන් සටන් කිරීමක් ජයග්‍රහණ සඳහා හේතු වන්නේ නැත. කෙනෙක් උත්සහ කළ යුත්තේ හා ඉදිරියට යා යුත්තේ යහපත් පාලනයක් ඇති කර ගැනීම සඳහාය. ධම්මපදයේ 168 වෙනි ගාථාවෙන් මේ බව විෂද කරයි.

උත්තිට්ඨෙ නප්පමජ්ජෙය්‍ය
ධම්මං සුචරිතං චරෙ
ධම්මචාරී සුඛං සේති
අස්මිං ලෝකේ පරම්හි ච[20]

පිඬු සිඟා යෑමේ දී පිණ්ඩපාත චාරිකා වත නො ඉක්මවිය යුතුය. භික්ෂාචර්ය ධර්මයෙහි සකස්ව හැසිරිය යුතුය. භික්ෂාචර්ය ධර්මයෙහි හැසිරෙන භික්ෂූහු මෙලෝ පරලෝ දෙකෙහිම සුවසේ වසති.

යහපත වෙනුවෙන් උත්සාහ කිරීම හා යහපත වෙනුවෙන් යෙදීම හැකිතාක් දියුණු කරගත යුතු බව හයවෙනි ගිරි ලිපියෙහි සඳහන් වේ.''උට්ඨාත, පරතවම, අප්පමාද'' යන වදන් තුළින් ඒ බව පැහැදිලි වේ. උසස් තත්වයකට උප්පත්තිය ලබා ගැනීම පමණක් දිව්‍ය ලෝකයකට යෑමට මග නොවීය. ඕනෑම පුද්ගලයෙක් ගුණ ධර්මවලින් පිරීම ඒ සඳහා හේතුවක් බව කියයි.

උතුම් ගුණ දහම් යමෙක් දියුණු කරයි නම් ඔහු ජයග්‍රහණය ලබන්නෙකි. එය ඔහුගේ ජයග්‍රහණයක් පමණක් නොවේ. ආත්ම දමනය, කළගුණ සැලකීම, සංයමය ඒ අතර වැදගත් කරුණු ලෙස දක්වා ඇත.

''දෙවියන් ප්‍රියකරවන ප්‍රියදර්සි රජ විසින් යශෝකීර්තිය හා වෙනත් යහපත නැමැති මාගේ රට වාසී ජනයෝ ධර්මය ඇසීමට රිසි ඇතිව ධර්ම ශ්‍රවණය හා ධර්මානුකුල කටයුතු කෙරෙත්වා මේ සඳහා ම හටගත් යසස් හා කීර්තියෙන් යුත් පියදසි රජ ධර්මය හැර වෙන සම්පත් ඉසුරු කියන්නීය මහත්ඵල මහානිසංසය යි නොසිතයයි. දෙවියන්ට ප්‍රිය ප්‍රිදසිරජ ධර්මානුකුල යශස්කීර්ති ලැබීමට ආසාවන්නේය. පියදසී රජ යමක් විධානය කරන්නේ ද ඒ සියල්ල පරලොව අර්ථය පිළිබඳවම වේ. එකෙසේ ද සියල්ලෙහිම අල්පේච්ඡතාව වනාහි විපත්තියෙන් තොරය පාපාය සමාන විපතක් නැත. කුදු මහත් සිය නපුරුකම් අත්හැර පාපරහිත බව ලැබීම දුෂ්කරය.''[21]

දිල්ලි මිරුට් ස්ථම්භයේ දකුණු පස ලිපියෙහි ධර්ම දානය තරම් උතුම් උසස් දානයක් නොවන බව අශෝක රජු සඳහන් කරයි. ධම්මපදයේ 354 වෙනි ගාථාව එම අදහස ඉදිරිපත් කරයි''[22]

සබ්බදානං ධම්මදානං ජිනාති
සබ්බ රසං ධම්ම රසො ජිනාති
සබ්බං රතිං ධම්මරතී ජිනාති
තණ්හක්ඛයො සබ්බදුක්ඛං ජිනාති[23]

ධර්ම දානය සියලු දානයන් පරදවා දිනයි. ධර්ම රසය සියලු රසයන් පරදවා දිනයි. ධර්මය ඇසීමෙන් ඇතිවන සතුට අනික් සියලු සතුට පරදවා දිනයි. රහත්ඵලය සියලු දුක් පරදවා දිනයි.

"13 වෙනි ගිරි ලිපියේ සඳහන් කොට ඇති පරිදි තමා විශාල ජීවිත පරිත්‍යාගයක් සිදු කොට ජයග්‍රහණය ලැබූවත් එය තාවකාලික ජයග්‍රහණයක් බවත්, ඒ තුළින් කිසිවිටකත් සැනසීමක්, සුවයක් ලබාගත නොහැකි බවත්, ඒ සියල්ල තුළ ගැබ්ව ඇත්තේ කනස්සල්ල හා පසු තැවිල්ල පමණක් බවත් සඳහන් කරයි. කෙනෙකුට ක්‍රෝධ නොකිරීමෙන් සියල්ල ජයග්‍රණය කළ හැකි බව පෙන්වා දී තිබේ. ඒ බව ධම්මපදයේ 223 ගාථාවෙන් ද උද්ධරණය කෙරේ."[24]

අක්කෝධේන ජිනේ කෝධං
අසාධුං සාධුනා ජිනේ
ජිනේ කදරියං දානේන
සච්චේන අලිකවාදිනං[25]

ක්‍රෝධ නොකිරීමෙන් ක්‍රෝධ කරන තැනැත්තා ජයගත යුතුය. සත්පුරුෂ ගුණයෙන් අසත්පුරුෂයා ජයගත යුතුය. ත්‍යාගයෙන් තද මසුරු බව ජයගත යුතුය. ඇත්ත කීමෙන් බොරු කියන තැනැත්තා ජයගත යුතුය.[26]

"දේවානම් පියතිස්ස රජුගේ අභිෂේකයෙන් අටවෙනි වර්ෂයේ දී කළිඟුරට අත්පත් කර ගන්නා ලදී. (එහි දී) මිනිසුන් එක්ලක්ෂ පනස්දහසක් අල්වාගෙන යන ලදී. එක් ලක්ෂයක් මරන ලදී. එවැනි තවත් බොහෝ වාර ගණනක් මරණයට පත් විය. ඒ කළිඟු රට අත්පත් කර ගැනීමෙන් පසු තියුණු වූ ධර්ම පාලනයත් ධර්ම ක්‍රියාවක් ධර්මානුශිෂ්ටියත් දූන් දේවානම් පිය (රජු) විසින් (පනවනු ලැබේ) ඒ දිනුම දිනුමක් නොවන හෙයින් ද මිනිසුන්ට හිරිහැරය මරණය සහ පිටුවහල් කිරීම එයින් සිදු වූ හෙයින් ද දේවානම්පිය (රජුට) දූන් ඒ ගැන ළතැවිල්ලක් හටගෙන තිබේ. එම ශෝකය බහුල වශයෙන් ද බැරෑරුම් වශයෙන් ද දේවානම්පියතිස්ස රජුට දූනෙයි."

චිරප්පවාසිං පුරිසං
දූරතෝ සොත්ථිමාගතං
ඤාතිමිත්තා සුහජ්ජා ච
අභිනන්දති ආගතං"[27]

පුද්ගලයෙකු සඳහා යහපත පැමිණ ඇත්තේ දුර සිටය. උප්පත්තිය ලැබූ අය ගැන ඥාති මිත්‍රයෝ හා යහළුවෝ සතුටු වෙති. එමෙන් ම කළ පිං මෙලොවින් පරලොවට ගිය කල්හි සිය ඥාතියෙක් පැමිණෙන ලෙස පිළිගනු ලබයි. දුර සිට තමන් වෙත පැමිණෙන ඥාතිමිත්‍රාදීන් ආදරයෙන් වැළඳගනී. එසේ ම කළ පිං පුද්ගලයා මෙලොවින් පරලොවට ගිය කල්හි ප්‍රිය ඥාතියෙක් පැමිණෙන ලෙස පිළිගනු ලබත්. මේ පරිද්දෙන් අශෝක ශිලා ලේඛනවල සඳහන් අශෝක ධර්මයට අනුව නිර්වාණගාමී ප්‍රතිපදාවට අයත් පරම නිෂ්ඨාව කේන්ද්‍ර කරගත් ධර්මයක් ජනතාව වෙත ප්‍රදානය කිරීමට රජුට අවශ්‍යතාවක් නොතිබූ බව ඔහුගේ ප්‍රකාශයන්ගෙන් පැහැදිලි වේ. ඔහුට අවශ්‍ය වූයේ රාජ්‍ය පාලන කාර්ය පහසුවෙන් ගෙන යෑම සඳහා පහසුම මාර්ගයක් බුදු දහම තුළින් ගොඩනගා ගැනීමයි. ඒ සඳහා බුදුදහම ආශ්‍රයෙන් තෝරාගත් ධර්ම කොටස් පහසුවෙන් සාමාන්‍ය ජනයාට පවා තේරුම්ගත හැකි අයුරින් නිර්මාණය කොට ප්‍රදර්ශනය කර තිබීම එහි ඇති සුවිශේෂත්වය යි. මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයෙහි දැක්වෙන 29 වන වගන්තිය මෙසේය. ------, සෑම කෙනෙකුටම තම පෞරුෂත්වය නිදහස්ව පූර්ණ ලෙස සංවර්ධනය කර ගැනීමෙහිලා තමන්ගෙන් ප්‍රජාවට ඉටුවිය යුතු යුතුකම් රැසක් පැවරී ඇත. කෙනෙකුගේ අයිතිවාසිකම් හා නිදහස ක්‍රියාත්මක කිරීමේ දී සීමාවන් තිබිය යුත්තේ හුදෙක් වෙනත් අයගේ අයිතිවාසිකම් හා නිදහස පිළිගැනීම හා ගෞරවය පිණිසත් සදාචාරාත්මක ගුණවග ාවට අවශ්‍යතාවයන් පිරිමැසීමටත් ප්‍රජාතතන්ත්‍රවාදී සමාජයක මහජන සාමය සහ පොදු සුබසිද්ධිය ආරක්ෂාවීම පිණිසත් පැනවෙන නීති මගින් පමණි----, යුක්ති ධර්මය සොයාගිය අශෝකගේ රාජ්‍ය ප්‍රතිපත්තියෙහි ද මූලික ස්ථානය දී තිබුණේ ගුණවගාව සඳහා ය.[28]

භාරතයේ පහළ වූ අති ශ්‍රේෂ්ඨ රාජ්‍ය පාලකයෙකු ලෙස අශෝක අධිරාජ්‍යයා පෙන්වාදිය හැකිය. තම රාජ්‍ය ස්ථාවර කර ගැනීම සඳහා යුද්ධය ජයග්‍රහණය කළත් එහි ඇති බිහිසුණු බව සහ මිනිස් ඝාතන හේතුවෙන් අතිශය කම්පනයට පත්ව සිටි ඔහුට සුමණ සාමණේරයන් වහන්සේගේ සන්සුන් ගමන හා ඉරියව් මහත් සැනසීමක් ලබා දෙන්නට විය. මේ කාල පරිච්ඡේදය වන විට බුදුරජාණන් වහන්සේගේ පරිනිර්වාණය සිදු වී වසර දෙසිය දහ අටක් පමණ කාලයක් ගත

වී හමාරය. ඒ වන විට බුදු දහම තුළ යම් යම් පිරිහීම් රාශියක් ගොඩනැගෙමින් පැවැති යුගයකි. ඒ අනුව මොග්ගලිපුත්ත තිස්ස තෙරුන්ගේ මඟ පෙන්වීමෙන් අශෝක රජුගේ රාජ්‍ය අනුග්‍රහයෙන් සියලු දුර්මතධාරී පිරිස ඉවත් කොට තෙවෙනි ධර්ම සංගායනාව සිදු කරන ලදී. ඉන් පසු සාසන පාරිශුද්ධත්වයත් සමගින් ඇරඹි රාජ්‍ය සංකල්පය තුළට බුදු දහමේ ආභාසය එකතු කොට ගෙන සදාචාර සම්පන්න දැහැමි රාජ්‍යයක් ගොඩනංවා ගැනීම පිණිස මෙසේ බුදු දහමට අනුකූලවම අන පනත්, නීතිරීති සකස් කොට ගෙන තම පාලන කටයුතු ඉදිරියට පවත්වාගෙන යන ලදී. ඒ සඳහා බුදුරජාණන් වහන්සේ දේශිත සූත්‍ර බොහෝ ප්‍රමාණයක ධර්ම කරුණු එකතු කොට තම අමාත්‍යවරුන්ගේ අනුග්‍රහය ඇතිව ඉතා ක්‍රමිකව ජනතාව අතරට යැවීමට උත්සාහ ගෙන තිබේ. විශේෂයෙන් එම ශිලා ලේඛන සියල්ලම පරීක්ෂා කර බැලීමේ දී බුදු දහමේ ආභාසය මැනවින් උද්ධරණය කෙරේ.

## ආන්තික සටහන්

1. ඥානවිමල හිමි, බෙල්ලන, <u>අශෝක ශිලාලේඛන,</u> සමයවර්ධන පොත්හල, මරදාන, කොළඹ, 2000, පි. 1.
2. ගුණවර්ධන, නදීෂා ෂර්මලී, <u>අශෝක අධිරාජයාගේ ප්‍රජා පාලනය</u>, චතුර මුද්‍රණාලය, අවිස්සාවේල්ල පාර, වැල්ලම්පිටිය, 2004, පි. 50.
3. කරුණාරත්න, ඩබ්ලිව්. ඇස්, <u>ධර්මාශෝක රජතුමා හා බෞද්ධ ශිෂ්ටාචාරය</u>, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ. 1991, පි.7 8-79.
4. වික්‍රමසූරිය, ඩී. ඊ, <u>ශිලා ලේඛන සංග්‍රහය</u>, සීදේවී ප්‍රකාශන, කොළඹ, 1929, පි. 22.
5. එම. පි. 62-63.
6. ඥානවිමල හිමි, බෙල්ලන, <u>අශෝක ශිලාලේඛන,</u> සමයවර්ධන පොත්හල, මරදාන, කොළඹ, 2000, පි. 16-19.
7. කරුණාරත්න, ඩබ්ලිව්. ඇස්, <u>ධර්මාශෝක රජතුමා හා බෞද්ධ ශිෂ්ටාචාරය</u>, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ. 1991, පි. 78.
8. ඥානවිමල හිමි, බෙල්ලන, <u>අශෝක ශිලාලේඛන,</u> සමයවර්ධන පොත්හල, මරදාන, කොළඹ, 2000, පි. 13.
9. පිදස්සි හිමි, අදිකාරම්, ඊ. ඩබ්ලිව්, <u>අසෝක සිරිත සහ අසෝක සෙල් ලිපි,</u>

බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන සමිතිය, මහනුවර, 1966, පි. 26.

10. සංයුත්ත නිකාය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, බු.ජ.ත්‍රි.ග්‍ර.මා.පු, නැදිමාල, දෙහිවල, 2005, පි. 60.
11. ඥානවිමල හිමි, බෙල්ලන, අශෝක ශිලාලේඛන, සමයවර්ධන පොත්හල, මරදාන, කොළඹ, 2000, පි. 16.
12. ඥානවිමල හිමි, බෙල්ලන, අශෝක ශිලාලේඛන, සමයවර්ධන පොත්හල, මරදාන, කොළඹ, 2000, පි. 22.
13. ඛුද්දක නිකාය, ධම්මපදපාළි, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, බු.ජ.ත්‍රි.ග්‍ර.මා.පු, නැදිමාල, දෙහිවල, 2005, පි. 70.
14. පිදස්සි හිමි, අදිකාරම්, ඊ. ඩබ්ලිව්, අසෝක සිරිත සහ අසෝක සෙල් ලිපි, බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන සමිතිය, මහනුවර. 1966, පි. 26.
15. ඥානවිමල හිමි, බෙල්ලන, අශෝක ශිලාලේඛන, සමයවර්ධන පොත්හල, මරදාන, කොළඹ, 2000, පි. 23.
16. එම. පී.20.
17. ඤාණෝභාස තිස්ස හිම, මොරගොල්ලේ, ධම්මපද විවරණය, ඇම්. ඩී, ගුණසේන සහ සමාගම, කොළඹ, 2010, පි. 443.
18. ඤාණෝභාස තිස්ස හිම, මොරගොල්ලේ, ධම්මපද විවරණය, ඇම්. ඩී, ගුණසේන සහ සමාගම, කොළඹ, 2010, පි. 336.
19. HULTZSCH, E, INSCRIPTIONS OF ASOKA,INDOLOGICAL BOOK HOUSE, DELHI, YARANASI, INDIA,1924, p. 31.
20. ඤාණෝභාස තිස්ස හිම, මොරගොල්ලේ, ධම්මපද විවරණය, ඇම්. ඩී, ගුණසේන සහ සමාගම, කොළඹ, 2010, පි. 349.
21. වික්‍රමසූරිය, ඩී. ඊ, ශිලා ලේඛන සංග්‍රහය, සීදේවී ප්‍රකාශන, කොළඹ, 1929, පි. 55.
22. එම. පී. 42.
23. ඤාණෝභාස තිස්ස හිම, මොරගොල්ලේ, ධම්මපද විවරණය, ඇම්. ඩී, ගුණසේන සහ සමාගම, කොළඹ, 2010, පි. 673.
24. ඥානවිමල හිමි, බෙල්ලන, අශෝක ශිලාලේඛන, සමයවර්ධන පොත්හල, මරදාන, කොළඹ, 2000, පි. 30.
25. ඤාණෝභාස තිස්ස හිම, මොරගොල්ලේ, ධම්මපද විවරණය, ඇම්. ඩී, ගුණසේන සහ සමාගම, කොළඹ, 2010, පි. 455.
26. පිදස්සි හිමි, අදිකාරම්, ඊ. ඩබ්ලිව්, අසෝක සිරිත සහ අසෝක සෙල් ලිපි, බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන සමිතිය, මහනුවර, 1966, පි. 26.

27. ඤාණෝභාස තිස්ස හිමි, මොරගොල්ලේ, ධම්මපද විවරණය, ඇම්. ඩී, ගුණසේන සහ සමාගම, කොළඹ, 2010, පි. 447.
28. ගුණවර්ධන, නදීෂා ෂර්මලී, අශෝක අධිරාජයාගේ ප්‍රජා පාලනය, චතුර මුද්‍රණාලය, අවිස්සාවේල්ල පාර, වැල්ලම්පිටිය, 2004, පි. 50.